ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් සමාගමේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ වෙනත් ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ

නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස්	නිර්දේශය
දැක්වීම		

(අ) මූල්‍ය වාර්තාකරණ සඳහා සංකල්පනාත්මක රාමුවෙහි 2.34 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන තොරතුරු පැහැදිලිව තේරුම්ගත හැකි වන පරිදි වර්ග කිරීම, ඉදිරිපත් කිරීම හා ගුණාංගීකරණය කළ යුතුය. එසේම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 (LKAS 01) හි 27 වන වගන්තිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැර අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට පිළියෙල කළ යුතුය. ඒ අනුව කාලච්ඡේදයට අදාළ ස්ථාවර තැන්පතු පොළිය උපචිත පදනමට අයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන තිබුණු අතර, ලැබිය යුතු පොළී ආදායම්, ස්ථාවර තැන්පතුවල අයෝජනය කිරීම් සහ ස්ථාවර තැන්පතු ඉවත්කර ගැනීම් කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුළ ගැලපීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනයවූ මුදල් ප්‍රවාහය රු.28,193,418කින් අඩුවෙන් වාර්තා කර තිබූ අතර අයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනනයවූ මුදල් ප්‍රවාහය රු.28,193,418කින් වැඩියෙන් වාර්තාකර තිබුණි.	මෙය වර්ගීකරණයේ ඇති වූ දෝෂයක් වන අතර ඉදිරියේදී නිවැරදි කරනු ඇත.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අනුව මුදල් ප්‍රවාහ වර්ග කිරීම හා ඉදිරිපත් කිරීම කළ යුතු බව.
(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 (LKAS 07) හි 07 වන ඡේදය අනුව සාමාන්‍යයෙන් මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ග කිරීමට සුදුසුකම් ලබනුයේ ආයෝජන මිලට ගත්/ අත්පත්කරගත් දින සිට කෙටිකාලීන පරිණතවීමක්, එනම් මාස 03 ක් හෝ ඊට අඩු කාලයක් තුළදී පරිණත වන ආයෝජන වේ. නමුත් සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ මුදල් හා මුදල් සමාන දෑ ලෙස	මෙය මුදල් හා මුදල් සමාන දෑ වර්ගීකරණයේ ඇති වූ දෝෂයකි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ගිණුම්කරණ ප්‍රමිත අනුව මුදල් හා මුදල් සමාන දෑ ලෙස හඳුනාගත යුතු වන්නේ මාස තුන හෝ ඊට අඩු කාලයක් තුළ පරිණත වන ආයෝජන පමණක් විය යුතු බව.

හෙළිදරව් කර ඇති වටිනාකම තුළ රු.77,398,510 ක් වටිනා මාස 6 ට පසු පරිණත වන ස්ථාවර තැන්පතු 02 ක් වාර්තාකර තිබුණු බැවින් එම වටිනාකමින් මුදල් හා මුදල් සමාන දෑ වැඩියෙන් දක්වා තිබූ අතර ස්ථාවර තැන්පතු එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.		
(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 (LKAS 08) හි 39 වන ඡේදය අනුව ආයතනයක් විසින් ප්‍රවර්තන වර්ෂය සහ අනාගත කාලයක් සඳහා බලපාන ගිනුම්කරණ ඇස්තමේන්තුවල වෙනස් කිරීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ සංකල්පනාත්මක රාමුවෙහි 2.34 අනුව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන තොරතුරු පැහැදිලි සහ සංක්ෂිප්තව ඉදිරිපත් කළ යුතුය. නමුත් සමාගම විසින් 2024 වර්ෂය තුළ ඵලදායි ජීව කාලය නැවත සංශෝධනය කළ රු.9,426,488 ක ලී බඩු සහ උපකරණ හා යන්ත්‍රෝපකරණ අයිතම 04 ක් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් නොකිරීම හේතුවෙන් පරිශීලකයන්හට සමාලෝචිත වර්ෂය තුළ ඵලදායි ජීව කාලය සංශෝධනය කළ වත්කම් හඳුනාගත නොහැකි විය.	වත්කම් සමීක්ෂණ කමිටුව මගින් සිදුකරන ලද නිර්දේශයන්ට අනුව 2024 වර්ෂයේදි අයිතමයන් 4ක ඵලදායි ජීව කාලය සංශෝධනය කරන ලද අතර තවත් අයිතමයන් 12ක ජීව කාලය 2023 වසරේ සංශෝධනය කරන ලදී. එවිට ජීව කාලය සංශෝධනය කළ මුළු වත්කම් ප්‍රමාණය අයිතම 16කි. මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 5.4 යටතේ ජීව කාලය සංශෝධනය කරන ලද අයිතම 16 හි විස්තර වෙන වෙනම හෙළිදරව් කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිත අනුව, කාලච්ඡේදය තුළ ඵලදායි ජීව කාලය සංශෝධනය කළ වත්කම් පරිශීලකයන්හට හඳුනාගත හැකි වන පරිදි වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු බව.
(ඈ) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 16 (LKAS 16) හි 7b අනුව වත්කම් හඳුනාගැනීම සඳහා ඒවායේ පිරිවැය නිශ්චිතව තක්සේරුකර ගත හැකිවිය යුතුය. නමුත් වත්කම් සත්‍යාපන කමිටුව (Asset Verification Committee) විසින් භෞතිකව පරීක්ෂාවේදී	රු.492,216 ක් වූ ලී බඩු හා රු.1,540,035 ක් වූ පරිගණක උපාංග භෞතිකව නිරීක්ෂණය වී ඇත. නමුත් මෙම වත්කම් 2009-2017 අතර කාලය තුළ මිලදී ගත් ඒවා වන	ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස හඳුනාගත යුත්තේ පිරිවැය නිශ්චිතව තක්සේරුකර ගත හැකි වත්කම් විය

නිරීක්ෂණය කර ගත නොහැකි සහ කළමනාකරණයට අනුව පිරිවැය වෙන් වෙන්ව හඳුනා ගැනීමට නොහැකි බවට සඳහන් පිළිවෙලින් රු.492,216 ක් සහ රු.1,540,035 ක් වූ ලී බඩු හා උපකරණ සහ පරිගණක හා උපාංග යන වත්කම් මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණි.	බැවින් එම වත්කම්වලට අදාළ නියම පිරිවැය අදාළ වත්කම සමඟ වෙන වෙනම හඳුනා ගැනීමට නොහැකි තත්වයක් පමණක් ඇති බව වත්කම් සමීක්ෂණ කමිටුව වාර්තා කර ඇත. එම වත්කම් භෞතිකව ආයතනයේ පවතින බව කමිටුව විසින් නිරීක්ෂණය කර ඇත. එබැවින් විගණන විමසුමෙහි සඳහන් පරිදි රු.492,216 ක් වූ ලී බඩු හා උපකරණ සහ රු.1,540,035 ක් වූ පරිගණක හා උපාංග මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් පෙන්වීමක් සිදු වී නොමැත.	යුතු බව.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අ) 1954 අගෝස්තු 9 දිනැති අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 වන වගන්තිය	යම් ආයතනයක් සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස සමාගම විසින් 2024 වර්ෂයේදී මෙහෙයුම් කාර්ය මණ්ඩලයේ සේවකයින්	සමාගමේ සේවා අවශ්‍යතාවය අනුව පැය 24 සේවා මුරය මෙහෙයුම් කටයුතු කාර්යක්ෂමව හා බාධාවකින් තොරව සිදු කිරීම සඳහා හඳුන්වා දී ඇත. එකී පැය 24 සේවා මුර ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම	සේවකයන්ගේ වැඩ කළ යුතු කාලය පනතේ දක්වා ඇති අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව.

	47 දෙනෙකු පැය 24 ක වැඩමුර සඳහා සේවයේ යොදවා තිබුණු අතර සේවය ලබාගෙන තිබුණේ සතියකට දින 02ක් පමණි.	සඳහා 25/02/2021 දරන අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලැබී ඇත.	
(ආ) 2024 ජුලි 26 දිනැති අංක ED/EDR/PRE/2024/6-04B දරන මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛයේ 5 වන වගන්තිය, 2024 පෙබරවාරි 28 වන දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.1 වන වගන්තිය සහ 2023 සැප්තැම්බර් 27 දිනැති අංක 01/2021(ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වන වගන්තිය	අත්‍යාවශ්‍ය සේවක බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය හා ඡන්ද විමසීම් කාල සීමාව තුළ සිදුකර පත්කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ එකඟතාවය ලබාගත යුතු නමුත් 2024 අගෝස්තු 02 දින මැතිවරණ කොමිෂමේ එකගතාවයකින් තොරව සේවකයන් බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. එම දිනෙන් පසුව 2024 අගෝස්තු 06 සිදුකළ ඉල්ලීම සඳහා එකඟතාවය ලෙස තාක්ෂණ ගණයේ සේවකයන් 10 ක් බඳවා ගැනීම සඳහා පමණක් එකඟතාවය ලබාදී තිබුණි. නමුත් ඉල්ලුම්කර තිබූ සේවකයන් 12 දෙනාගෙන් 11 දෙනෙකුම තාක්ෂණ ගණයේ නොවන සේවකයන් වූ අතර රු.56,280 ක වියදමක් දරා ඡන්ද	2024.08.19 දින මැතිවරණ කොමිෂන් සභාව විසින් EDR/PE/2024/S-814 අප වෙත යොමුකල ලිපිය අනුව අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා පුරප්පාඩු පවතින තනතුරු 10 සඳහා බඳවා ගැනිම් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ අවසරය ලැබී ඇත. සේවක බඳවා ගැනීම් සඳහා දැන්වීම් පල කිරීම ඡන්ද විමසීමේ කාල සීමාව තුළ දින 04 පසුව හා දැන්වීම් පලකර දින 17කට පසුව අනුමැතිය ලැබී ඇත. ආයතනයේ ඉදිරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කටයුතුවලදී මෙවැනි සිදුවීම් සිදු නොවීමට අවශ්‍ය කටයුතු කරනු ඇත. 2024.08.06 ආයතනය මගින් අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා සේවකයින්	අත්‍යාවශ්‍ය සේවක බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය හා ඡන්ද විමසීම් කාල සීමාව තුළ සිදුකරන පත්කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ පූර්ව එකඟතාවය ලබාගත යුතු බව.

	විමසීමේ කාලය තුළ සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණ නමුත් බඳවා ගැනීම් සිදුකර ද නොතිබුණි.	බඳවා ගැනීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂමට යොමු කළ ලිපියට අනුව එම සියළුම තනතුරු වෙන් වෙන් වශයෙන් විස්තාරාත්මකව දන්වා ඇත. 2024.08.02 ආයතනයේ ඇබෑර්තු පුවත්පත් දැන්වීම් 03ක (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) යොමු කොට ඇත. එහිදී ආයතනයේ පුරප්පාඩු තනතුරු නිවැරදිව දක්වා ඇත. මෙම පුරප්පාඩු තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වුවද මේ දක්වා බඳවා ගැනීම් සිදුකර නොමැත.	
(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි (Operational	3.2 (ii) වගන්තිය අනුව සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණු අතර වගන්තිය 3.3 (ii) අනුව	අප ආයතනය සඳහා අනුමත සේවක සංඛ්‍යාව සමඟ සංවිධාන සටහන, විධිමත් බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය 2024.06.13 ලබා ගෙන ඇති අතර රේඛීය අමාත්‍යංශයේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අනුමැතිය	සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තු

Manual) 3.2 (ii) වගන්තිය හා 3.3 (ii) වගන්තිය	සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම අනුමත සේවක සංඛ්‍යාව සමඟ සංවිධාන සටහන සකස් කර තිබිය යුතු වුවත්, සමාගම එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.	ද ලබාගෙන ඇත. මෙය දැනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කොට ඇත. මෙය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කොට ඇත. ඉන්පසු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වාචිකව දැනුම් දුන් පරිදි නව අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නැවත අනුමැතිය ලබා ගැනීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය (SOR) සේවක සංඛ්‍යාව සමඟ සංවිධාන සටහන යොමු කර ඇත.	වේ එකඟතාව ලබා ගත යුතු බව.

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අංක 25/2022 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛණයේ ii වන කොටසේ අයිතම 04 යටතේ තෙල් පොම්ප කිරීමේ ගාස්තු බදු නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බව දක්වා ඇතත් 2022 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා,	2024.12.10 දිනැති ලිපිය මගින් දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුව විසින් දන්වා එවා තිබුණේ පොම්ප කිරීමේ ගාස්තුව මෙම බද්දෙන් නිදහස් නොවන බවයි. ඒ අනුව 2024.12.11 වන දින සිට අප ගනුදෙනුකරුවන් වෙත නිකුත් කරන ඉන්වොයිසි මඟින්	රජය විසින් හඳුන්වාදෙන බදු පනත් අනුව අදාළ බදු එකතුකර රජයට ප්‍රේෂණය කළ යුතු බව.

2023 වර්ෂය සහ 2024 ජනවාරි සිට දෙසැම්බර් 10 දක්වා පිළිවෙලින් රු.115,462,139ක්, රු.420,136,784ක් හා රු.499,685,324ක් වූ තෙල් පොම්පකිරීමේ ගාස්තුව මත අයකල යුතු සමාජ ආරක්ෂණ බද්ද පිළිවෙලින් රු.2,960,568ක් රු.10,772,738ක් හා රු.12,812,393ක් වේ. එබැවින් මෙම කාලයන්ට අදාළ මුළු සමාජ ආරක්ෂණ බද්ද වන රු.26,545,699 ක බදු මුදලක් අයකර ගැනීමකින් තොරව ඉන්වොයිස් කර ඇති බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එම බදු මුදල ප්‍රේෂණය කිරීමට නොහැකි වී තිබුණි.

පොම්පකිරීමේ ගාස්තුව සඳහා ද සමාජ ආරක්ෂණ බද්ද අය කිරීම ආරම්භ කොට මෙය නිවැරදි කොට ඇති බව දන්වමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 243.4ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 243.8 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි සියයට 0.16ක අඩුවීමක් දක්නට ලැබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. විකුණුම් පිරිවැය සමාලෝචිත වර්ෂයේදී සියයට 27 ක් වැඩිවී තිබූ අතර මෙහෙයුම් කාර්යමණ්ඩලය සඳහා ගෙවන ලද වැටුප් රු.මි.53.2 කින්, එනම් සියයට 50.4 කින් ඉහළයාම සමස්ථ විකුණුම් පිරිවැය ඉහළ යාමට බලපා තිබේ.

ii. පරිපාලන වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 10 ක් ඉහළ ගොස් තිබූ අතර ඒ තුළ කාර්යාල සේවක වැටුප් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 39.9 කින් ද ආරක්ෂක වියදම් සියයට 33 කින් ද ඉහළ යාම බලපා තිබුණි.

iii. මූල්‍ය ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂය තුළදී සියයට 34 කින් අඩු වී තිබූ අතර මෙහෙයුම් නොවන ආදායම සියයට 90 කින් අඩු වී තිබුණි. ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. මිලියන 41.9 කින් අඩුවීම මෙයට ප්‍රධාන හේතුව වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

2023 වර්ෂයේ ජංගම අනුපාතය 5.16:1 ක් හා ක්ෂණික අනුපාතය 5.09:1 ක් වූ අතර 2024 වර්ෂය අවසානයට එම අනුපාත පිළිවෙලින් 8.26:1 ක් හා 8.08:1 ක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ කාර්යය වන්නේ ගනුදෙනුකරුවන් විසින් ලබා දෙන තෙල් ගබඩා කර, ඔවුන්ගේ ඉල්ලීම පරිදි නැව් සඳහා සපයා ගාස්තු අය කිරීම වේ. ඒ අනුව සමාගම භාරයේ ඇති මෙට්‍රික් ටොන් 1000ක ධාරිතාවයෙන් යුතු අංක 102 දරන තෙල් ටැංකියෙහි 2024 දෙසැම්බර් 31 දිනට 380 (HSFO) ඉන්ධන, Lanka Maritime Services Ltd හි මෙට්‍රික් ටොන් 162.257 ක් ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර තිබුණි. තවද, එම ආයතනය විසින් මෙම තෙල් නිදහස් කරගෙන නොමැති බැවින් හා 380 (HSFO) ඉන්ධන භාවිතයට නොගන්නා බැවින් වෙනත් ඉන්ධන වර්ගයක් ගබඩා කරගත නොහැකිව 2020 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතයට ගත නොහැකිව නිෂ්කාර්යව පැවතුණි.	ශ්‍රී ලංකා රේගුව විසින් රාජසන්තක කර තිබූ මෙ.ටො.162.257ක ප්‍රමාණය සම්බන්ධව පැවති නඩු කටයුත්ත මේ වන විට අවසන් වී ඇති බවත් එම ප්‍රමාණය ශ්‍රී ලංකා රේගුව විසින් අවස්ථා දෙකක් ටෙන්ඩර් කර ඇති බවට අප වෙත තොරතුරු ලැබී ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ ඇති මෙ.ටො. 72ක ප්‍රමාණය සම්බන්ධව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු හිමිකම පිළිබඳ ශ්‍රී ලංකා රේගුව විසින් විමසීම් කර ඇති අතර, එම ප්‍රමාණය පිළිබඳ හිමිකමක් නොමැති බව ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දන්වා ඇත. තව ද අප විසින් 2025.01.01 වන දින ලිපිය මගින් ඒ පිළිබඳ ශ්‍රී ලංකා රේගුවට දැනුම් දී ඇත.	අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡාකර තෙල් ටැංකි ඉඩකඩ කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු බව.

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මානව සම්පත් ක්‍රියාකාරකම් හා වැටුප් ලේඛන සම්බන්ධ කටයුතු අතින් (manual) සිදුවීම හේතුවෙන් කාර්යක්ෂමව හා ඵලදායීව කාර්යය ඉටුකිරීමට ක්‍රමෝපායක් අවශ්‍ය බැවින් 2021 වර්ෂයේ සිට රු.976,000ක් දරා ලබාගත් HR & Payroll පද්ධතිය මේ වන තෙක් ක්‍රියාත්මක කර ගත නොහැකි තත්ත්වයක පැවතීම හා HR & Payroll පද්ධතිය මගින් ලබාගත යුතු අවසාන ප්‍රතිඵලය වන වැටුප් පත්‍රිකා නිවැරදිව මුද්‍රණය කරවා ගැනිමට මේ වනතෙක් අපොහොසත්ව තිබුණු බැවින් දරන ලද වියදමට උපරිම ප්‍රතිලාභයක් ලබාගැනීමට නොහැකිවී තිබුණි.	මෙම HR & Payroll පද්ධතියේ පවතින දෝෂ පිළිබඳව තාක්ෂණික උපදෙස් ලබා ගැනීම සඳහා ජනාධිපති කාර්යංශයේ තොරතුරු තාක්ෂණ පිළිබඳ විශේෂඥයන් දෙදෙනෙකුගේ සහය මේ වන විට ලබා ගනිමින් පවතින අතර, එම අදාළ ආයතනයේ නිළධාරීන් සමඟ සාකච්ඡා වට දෙකක් පවත්වා නිවැරදි විය යුතු අංග පිළිබඳ ඔවුන් දැනුවත් කරන ලදී. ඒවා අධ්‍යයනය කොට ඒ පිළිබඳ ඉදිරි තීරණයක් දැනුම් දීමට එම සමාගම එකඟ විය.	දරන ලද වියදමට අදාළව HR & Payroll පද්ධතිය ස්ථාපිත කළ යුතු අතර ඒ මඟින් එම කාර්යය කාර්යක්ෂමව ඉටුකර ගැනීමට කටයුතු කළයුතු බව.